කුරුණෑගල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.10,165,200 ක් වූ කර්මාන්ත ණයහිමියන් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) රු.135,612 ක්වූ කර්මාන්ත පරිපාලන වියදම් ණයගැතියෝ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) ටොයොටා ඩබල් කැබ් රථයේ වටිනාකම වූ රු.7,900,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් සහ පරිත්‍යාග ලෙස ලැබූ රු.707,573 ක් වූ පුස්තකාල පොත් දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලිපි ද්‍රව්‍ය තොගය රු.166,107 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ විදුලි ගබඩා තොගය රු.168,447 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ වරිපනම් බදු හිඟය රු.16,721,705 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සංවර්ධන නිලධාරීන්ගේ 2013 සහ 2014 වර්ෂවල වැටුප්වලින් පළාත් පාලන දෙපාර්තමේන්තුව සෘජුව ගෙවූ රු.373,150 ක් වූ වැන්දඹු හා අනත්දරු දායකය ලැබියයුතු වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සංවර්ධන නිලධාරීන්ගේ ඉකුත් වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ රු.725,259 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) රු.12,649,406 ක් වූ මාස්පොත ආදාහනාගාර ඉඩම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඔ) රු.350,000 ක් වූ බුළුගහමුල වත්ත ඉඩම දෙවරක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) කොස්ගහමුලවත්ත ඉඩමේ රු.6,000,000 ක් වූ වටිනාකම රු.60,000,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) ස්ථාවර වත්කම් ලේඛණයේ දැක්වෙන ඉඩම් දෙකක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) ගොඩනැගිලි 06 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ච) සභාව සතු වාහන 03 ක වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.2.2 නොසැසඳුනු පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ හා අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.18,798,687 ක වෙනසක් පැවතුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

එකතු වටිනාකම රු.100,589,297 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ලේඛන හා උපලේඛන ආදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරීක්ෂාවක් කළ නොහැකි විය.

### 1.2.4 නීති ,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත සඳහන් අනුකුල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිතී , රීති රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 80 | සභාවේ සේවයේ නියුතු ඇප තැබිය යුතු වගකීම් දරන නිලධාරීන් 13 දෙනෙකු විසින් නියමිත ඇප මුදල් ලබා දී නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්ම වු වටිනාකම රු.13,722 ක් වු චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.124,733,524ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,327,915 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.86,405,609 ක වර්ධනයක් සිදුව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.1,283,746 ක්, රු.4,504,838 ක් සහ රු.85,934,794 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 147 ක් වූ අතර, තත්‍ය ආදායම රුපියල් මිලියන 184 ක් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 11 ක් වූ ලැබියයුතු ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 154 දක්වා වැඩි වී තිබුණි.

**2.3.2 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂයේ රු.13,363,000 ක්වූ ඇස්තමේන්තුගත වරිපනම් හා බදුවලින් රු.10,258,000 ක් අයකරගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,485,808 ක්වූ සමුච්චිත හිඟයෙන් පෙර වර්ෂවල හිඟ අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.3.3 වෙනත් ආදායම්**

සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 143 ක් අයවිය යුතුව තිබූ අතර, එයින් රුපියල් මිලියන 26 ක් පෙර වර්ෂවලට අදාළ විය.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,184,487 ක් වූ උසාවි දඩ මුදලක් හා රු.120,131,696 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිරවුල්වීමකින් තොරව පවතින රු.13,550 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු සම්බන්ධයෙන් වූ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මතභේදාත්මක ගණුදෙනු**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී මාර්ග සංවර්ධනයට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම සඳහා වූ ගිවිසුම්ගත ආයතනය විසින් මිළගණන්වලට අදාල කොන්දේසි කඩකිරීම හේතුවෙන් නැවත මිළගණන් කැඳවීමේදීද පෙර ගිවිසුම්ගත ආයතනයම තෝරාගැනීම මත පෙර මිළගණන් ඉක්මවා රු.226,890 ක් ගෙවා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ මිලදී ගැනීම් සිදු කිරීමේදී අදාළ පිරිවිතර පිළියෙල කර මිල ගණන් ලබාගෙන නොතිබුණු අතර, 2016 අවසන් මාස තුන තුළ අවස්ථා 27 කදී රු.873,215 ක භාණ්ඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් අවිධිමත් ලෙස තෝරාගෙන තිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

සුන්දරාපොළ ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර කුරුණෑගල මහ නගර සභාව සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාව එක්ව කසළ එක්රැස් කිරීම සඳහා වසර ගණනාවක සිට ගිවිසුම්ගතව කටයුතු කරමින් පැවතුණි. එසේ තිබියදීත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,097,298 ක් වැයකර නොදිරන කසළ එකතු කර වෙන් කිරීම සඳහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

-------------------------------------

නව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වැට හා බැම්ම රු.606,968 ක වියදමින් නිමකර මාස 06 ක් ගතවීමටත් පෙර රු.21,120 ක් වූ කම්බි කණු 10 ක් කැඩී තිබුණි.

**04. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී අනාවරණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ලේඛන, පොත්පත් , උපලේඛන නොපවැත්වීම හෝ යාවත්කාලීනව පවත්වා නොතිබීම. |

| | |
|---|---|
| | ලේඛන සහ ගිණුම් අතර වෙනස්කම් හා හඳුනා නොගත් ශේෂ පැවතීම. |
| | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සනාථ කිරීම සඳහා ලේඛන නොමැති වීම. |
| (ආ) ආදායම් පාලනය | හිඟ ආදායම් අයකිරීමේ දුර්වලතා සහ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධ ආදායම් අයකර නොතිබීම. |
| (ඇ) මිලදී ගැනීම් | ප්‍රසම්පාදන මගපෙන්වීම් අනුගමනය නොකිරීම. |